# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජූලි 2014

## (53) ව්‍යාපාර අධ්‍යයනය

(Business Studies)

මෙම ප්‍රශ්න පත්‍රය විෂය නිර්දේශයේ බොහෝ කොටස් ආවරණය වන පරිදි පිළියෙල කර තිබුණි. සමස්ථයක් වශයෙන් සලකා බලන විට මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ සාධන මට්ටම සතුටුදායක තත්ත්වයක පැවතුනි. එහෙත් සුළු අයදුම්කරුවන් පිරිසක් සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව පැහැදිලි විය. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු වන්නේ සාර්ථකව ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අයදුම්කරුවන් දැනුවත් කිරීමය. එක් එක් ප්‍රශ්නය වෙන් වශයෙන් ගෙන සලකා බැලීමේදී උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ අවධානයට ලක්වූ වැදගත් කරුණු පහත දැක්වේ.

## A - කොටස

### ප්‍රශ්න අංක **01** - ලකුණු 40
**(අනිවාර්ය ප්‍රශ්නයකි.)**

මෙම ප්‍රශ්නය අනු කොටස් 20 කින් යුක්ත බහුවරණ ප්‍රශ්නයකි. එක් කොටසකට ලකුණු 02 බැගින් මුළු ලකුණු ප්‍රමාණය 40 කි.

ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය සහ එයට අදාල ප්‍රායෝගික දැනුම බොහෝ දුරට ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නය සකසා තිබුණි. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ පිළිතුරු සපයා ඇතත් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමට බොහෝ දෙනෙකුට නොහැකි විය.

අනු අංක (E), (G), (N) සහ (S) යන කොටස් වලට නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන් කිහිප දෙනෙක් පමණි. ඒ සම්බන්ධයෙන් උත්තර පත්‍ර නිරීක්ෂණයන් මෙසේය:

(E) වෙක්පත් නිෂ්කාශන ක්‍රමය ක්‍රියාත්මක කරන ආයතන පිළිබඳව අයදුම්කරුවන් තුල මනා දැනුමක් නොතිබීම.

(G) අපනයන ප්‍රවර්ධන කලාප මගින් ව්‍යවසායකයන්ට පිරිනමන දිරි දීමනා පිළිබඳ අවබෝධය දුර්වල වීම.

(N) ස්වර්ණමය කොටස් (Golden Shares) පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති වීම.

(S) මුදලේ අගය ක්ෂය වීම සහ අව ප්‍රමාණය පිළිබඳ දැනුම අඩුකම මෙම ප්‍රශ්නය සඳහා වැරදි පිළිතුර තෝරා ගැනීම තුලින් දිස්වේ.

## B කොටස

### ප්‍රශ්න අංක **02** - ලකුණු 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** 2014 වර්ෂය සඳහා රාජ්‍ය අයවැය ලේඛනය මගින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා දුන් දිරි දීමනා සම්බන්ධයෙන් අයදුම්කරුවන් තුල ඇති අවබෝධය ඉතා දුර්වල මට්ටමක පැවති නිසා මෙම කොටසට ලබාගෙන ඇත්තේ ඉතා අඩු ලකුණු ප්‍රමාණයකි. එදිනෙදා ආර්ථිකයේ සිදුවන දෑ පිළිබඳව දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ.

**(b)** හවුල් ව්‍යාපාරයක් හා සසඳන විට කේවලස්වාමි ව්‍යාපාරයක පවත්නා අවාසි ලැයිස්තුගත කිරීමට බොහෝ අයදුම්කරුවන්ට හැකි වූ අතර නියමිත මුළු ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට සමත් විය.

**(c)** (i) සමුච්චිත වරණීය කොටස් (cumulative preference shares) සම්බන්ධයෙන් සපයා තිබූ පිළිතුරු බොහොමයක් සාර්ථක මට්ටමක පැවතුණි.

(ii) ආදි කර්තෘ කොටස් (founders shares) පිළිබඳව ඇති අවබෝධය ඉතා අඩු මට්ටමක පැවති අතර ප්‍රමාණවත් ලකුණු ලබාගෙන ඇත්තේ ස්වල්ප දෙනෙක් පමණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු** 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** ශ්‍රී ලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව මගින් සපයනු ලබන පහසුකම් පිළිබඳ සතුටුදායක පිළිතුරු සපයා නොතිබුණි. අපනයන ණය රක්ෂණ සංස්ථාව පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතා පහළ මට්ටමක පවතින බව පෙනී යයි.

**(b)** (i) රථවාහන රක්ෂණ ඔප්පු වලට අදාලව තෙවන පාර්ශව රක්ෂණ ඔප්පුව (Third Party Insurance policy) සම්බන්ධව කරුණු දැක්වීම 50% ක පමණ සාර්ථකත්වයක් පෙන්නුම් කර තිබුණි.

(ii) රථවාහන රක්ෂණ ඔප්පු වලට අදාලව පූර්ණාවරණ රක්ෂණ ඔප්පුව (Comprehensive/Full Insurance policy) පිළිබඳව නිරවුල් හා නිවැරදි අවබෝධයක් තිබුණේ අයදුම්කරුවන් ටික දෙනෙකු තුළ පමණි.

**(c)** පෞද්ගලික රක්ෂණ සමාගම් මගින් අනුගමනය කරනු ලබන කොන්දේසි සම්බන්ධව බහුතර අයදුම්කරුවන් පිරිසකට කිසිදු අවබෝධයක් නොමැති බව පැහැදිලි විය. නිවැරදි පිළිතුරු සැපයීමට සමත් වූයේ ඉතා ස්වල්ප දෙනෙක් පමණි.

**ප්‍රශ්න අංක 04 - ලකුණු** 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) ශ්‍රී ලංකා ආර්ථිකයේ සංවර්ධනය සඳහා කාර්යක්ෂම මූල්‍ය වෙළෙඳපොලක් පැවැත්වීමේ වැදගත්කම සම්බන්ධයෙන් අයදුම්කරුවන් තුළ ඇති අවබෝධය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. ඇතැම් අයදුම්කරුවන් මුදල් වෙළෙඳපොලේ සහ ප්‍රාග්ධන වෙළෙඳපොලේ නිර්වචනයන් දක්වා ඇති නමුත් ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයට ඇති වැදගත්කම පිළිබඳ කරුණු ඉදිරිපත් කර නොමැත.

(b) සීමාසහිත මධ්‍යම තැන්පතු (පෞද්ගලික) සමාගමේ ප්‍රධාන කාර්යයන් සඳහන් කිරීමට හැකි වී ඇත්තේ අයදුම්කරුවන් ඉතා ටික දෙනෙකුට පමණි.

(c) ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධනය කිරීම සඳහා රජය විසින් මෑතකදී ගෙන ඇති පියවරවල් දැක්වීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය. ප්‍රායෝගික කරුණු සම්බන්ධයෙන් ඔවුන් තුළ ඇති අවබෝධය ඉතා දුර්වල බව මෙයින් පෙනී යයි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු** 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) රේඛනය කරන ලද චෙක්පත් හඳුන්වා එක් එක් ප්‍රධාන රේඛන වර්ග සඳහා උදාහරණ දෙක(02) බැගින් සපයන ලෙස සඳහන් කර ඇති මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් සැලෙන ප්‍රමාණයකට නියමිත මුළු ලකුණු ප්‍රමාණයම ලබාගත හැකි විය. චෙක්පත් රේඛනය හා වර්ග පිළිබඳ මනා අවබෝධයක් ඔවුන් සතු විය.

(b) (i) චෙක්පතක් අගරු වීම සම්බන්ධයෙන් අයදුම්කරුවන් බොහෝ දෙනෙකු තුල නිවැරදි අවබෝධයක් තිබුණි.

(ii) චෙක්පතක් අගරු වීමට ප්‍රධාන හේතු දැක්වීමටද අයදුම්කරුවන් බහුතරයක් සමත් විය.

(c) (i) වාණිජ බැංකුවක් විසින් චෙක්පතක් අගරු කිරීමේදී භාවිත කරන අණකරු විමසීම (Refer to Drawer) යන පදය වැඩි දෙනෙකු නිවැරදිව දක්වා තිබුණි.

(ii) අයපත් උපලබ්ධි වී නැත (Effects not Realized) යන්නට නිවැරදි පිළිතුරු ලැබී තිබුණේ අඩු ප්‍රමාණයකි.

චෙක්පත් අගරු කිරීමේදී භාවිත කරන සටහන් පිළිබඳ මනා දැනුමක් බහුතර අයදුම්කරුවන් තුල නොමැති බව මෙහිදී පැහැදිලි විය.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) රටවල් නිදහස් වෙළෙඳාමට එරෙහිව සංරෝධක (barriers) පනවන්නේ මන්දැයි යන්න පැහැදිලි කිරීමට හැකි වූයේ ඉතා ස්වල්ප අයදුම්කරුවන් පිරිසක් පමණි. ඔවුන් තුලද ප්‍රමාණවත් අවබෝධයක් නොමැති බව පෙනී ගිය කරුණකි.

(b) "ස්ථාවර විදේශ විනිමය අනුපාතිකයේ" (Fixed Exchange Rate) අවාසි නිවැරදිව දැක්වීමට අයදුම්කරුවන් අසමත් විය.

(c) (i) අන්තර්ජාතික වෙළදාමට සම්බන්ධ වෙළෙඳ ගිවිසුම් (Trade agreements) පිළිබඳව තරමක් දුරට සාර්ථක පිළිතුරු සැපයීමට අයදුම්කරුවන් සමත් වී ඇතත් ලබාගෙන ඇත්තේ අඩු ලකුණු ප්‍රමාණයකි.

(ii) තීරු බදු නොවන වෙළෙඳ සංරෝධක (Non-tariff trade barriers) පිළිබඳව නිරවුල් අවබෝධයක් නොතිබීම නිසා ලකුණු ලබා ගැනීමට අසමත් විය.

**ප්‍රශ්න අංක 07 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

පහත සඳහන් දෑ සම්බන්ධව කෙටි සටහන් ලිවීමට තිබුණි. සමස්ථයක් ලෙස මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසකි. ඔවුන් අතුරෙන්ද සියළුම කොටස් වලට පිළිතුරු සපයා තිබුණේ සුළු අයදුම්කරුවන් පිරිසකි.

(a) <u>හෝනා දවස් (Lay Days)</u>

පිළිතුරු සැපයූ බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු දී තිබුණි.

(b) <u>ප්‍රකාශ කළ ප්‍රාග්ධනය (Stated Capital)</u>

මෙම කොටස සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන් සුළු ප්‍රමාණයකි.

(c) <u>හිස් පිටසන (Blank Endorsement)</u>

මෙම කොටසට පිළිතුරු සැපයූ බොහෝ අයදුම්කරුවන්ගේ පිළිතුරු බොහෝ ඒවා නිවැරදි නොවිය.

(d) වන්දි නොඉල්ලීමේ ප්‍රසාද දීමනාව (No Claim Bonus)

සැහෙන අයදුම්කරුවන් පිරිසක් මෙම කොටසට නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

(e) විදේශ විනිමය අනුපාතිකයේ අධි තක්සේරුව (Over Value of Foreign Exchange)

බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට පිළිතුරු තිබූ නමුත් ඒවා අතරින් නිවැරදි පිළිතුරු තිබුණේ ඉතා ස්වල්පයකි.

- - -

## විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:

1. ප්‍රශ්න පත්‍රය ලබා ගත් වහාම ආරම්භයේ දී ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** හොඳින් සැලකිලිමත්ව කියවා අනිවාර්ය ප්‍රශ්න සහ තෝරා ගතහැකි ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය. ප්‍රශ්න පත්‍රයේම උත්තර ලියා අමුණා තැබීම නොකළ යුතුයි.

2. ප්‍රශ්නය කීපවරක් හොඳින් කියවා මැනැවින් අවබෝධ කර ගෙන අසා ඇති කරුණු වලට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අදාල නොවන කරුණු ඇතුලත් නොකළ යුතුය.

3. පිළිතුරු සැපයීමේදී කාලය බෙදාගැනීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

4. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.

5. අත්අකුරු පැහැදිලිව ලිවීම මගින් පරීක්ෂකවරයාට උත්තර පත්‍රය කියවා හොඳින් අවබෝධ කරගැනීමට සැලැස්වීමෙන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට හැකිවනු ඇත.

6. පසුගිය වසරවල විභාග ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමෙන් විෂය දැනුම වර්ධනය කර ගැනීමටත්, වේගවත්ව පිළිතුරු සැපයීමේ නිපුණතාව ඇතිකර ගැනීමටත් හැකියාව ලැබේ.

7. දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ.

8. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -